# ප්‍රසම්පාදන දැන්වීම

## ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත් සභාව

### වාහන රක්ෂණ සඳහා ප්‍රසම්පාදනය – 2020/2021

### මූල්‍ය: ශ්‍රී ලංකා රජයේ මුදල්

### ලංසු ආරාධනා අංකය: NP/05/13/03/IC/15/2020

1. ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් උතුරු පළාත යටතේ වූ වාහන 1337කට රක්ෂණ සේවය සැපයීමට සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

2. ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියට අනුව ලංසු කැඳවනු ලැබේ.

3. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, උතුරු පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, කයිතඩි, යාපනය** (දුරකථන අංකය:021-222-0831, ෆැක්ස් අංකය:021-221-6695, විද්‍යුත් තැපැල:motortrafficnp@gmail.com) යන ලිපිනය වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකිවන අතර, ලංසු ලියකියවිලි මෙම ලිපිනයෙහි වැඩ කරන දිනයන්හි පෙරවරු පැය 09.00 සිට පස්වරු පැය 02.30 දක්වා පරීක්ෂා කළ හැකිය.

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස ජය ලැබූ ලංසුකරු, අසාධු ලේඛනගත නොවිය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කළ තැනැත්තෙකු විය යුතුය.

   අ. ලංසුකරු වලංගුවේ පවතින ව්‍යාපාරය ලියාපදිංචි කළ තැනැත්තෙකු වීම.

   ආ. උතුරු පළාත තුළ තම කාර්යාලය හෝ ශාඛා හෝ තිබීම.

5. සුදුසුකම ලබාගැනීම පිණිස ලංසුකරුවන් 2වන කොටසේ ප්‍රසම්පාදන දත්තවල සඳහන් අවම මූලික සුදුසුකම්වලින් සමන්විත විය යුතුය.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙළ කරන ලද ලංසු ලියකියවිලි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, උතුරු පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, කයිතඩි, යාපනය යන ලිපිනය වෙතින් වැඩ කරන දිනයන්හි 2020.06.01 වැනි දින සිට 2020.06.19 වැනි දින දක්වා පෙරවරු පැය 09.00 සිට පස්වරු පැය 02.30 දක්වාවන කාලසීමාව තුළ ලිඛිත ඉල්ලීමක් සමග ආපසු නොගෙවනු ලබන තැන්පතුව වශයෙන් රු.3,000.00ක් මුදලින් ගෙවීම් කර ලබාගත හැකිය.

7. ලංසු ලියකියවිලි 2020.06.22 වැනි දින පෙරවරු පැය 10.00ට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, උතුරු පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, කයිතඩි, යාපනය යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. සියළුම ලංසු, ප්‍රසම්පාදන වේලාව අවසන් වූ වහාම ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ විවෘත කරන අතර ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සියළුම ලංසුකරුවන් රුපියල් 300,000.00ක වටිනාකමින් වූ බැංකු ලංසු ඇපකරයක් ගෙවිය යුතුය.

9. කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව මෙම ලංසු කැඳවීම මුළුමනින් පිළිගැනීමට හෝ කොටස් වශයෙන් පිළිගැනීමට හෝ මුළුමනින් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිට සම්පූර්ණ බලය ඇත්තේය.

ජ්.පත්තිනාදන්,
සභාපති,
ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව,
A-9 පාර, කයිතඩි,
යාපනය.